# ආගමන වංචා පිළිබඳ අනතුරු ඇඟවීම!

## මෙවැනි ආගමන අවස්ථාවක් ලැබෙනවා නම්?

---

කැනඩා වීසා සහ රැකියා දීමට සහතිකවීම!

රැකියා අවසර පත්‍ර ලබා දීමට සහතිකවීම! නෙමිලේ ශිෂ්‍යත්ව! අවම හෝ කිසිම පළපුරුද්දක් නැතුව කැනඩාවේ ඉහල වැටුප් සහිත රැකියා! නෙමිලේ ගුවන් ගමන් ප්‍රවේශ පත්‍ර සහ නවාතැන් පහසුකම් සහිත රැකියා! විශේෂ වැඩසටහන්! හෝටල් පිරිසිදු කරන්නන්ට මසකට ඩොලර් 4000 ක් උපයන අවස්ථා!

---

**මෙවැනි වංචා වලට ඔබ ගොදුරු වන්න එපා.**
**ඔබට ලැබෙන මේ අවස්ථාව ඇදිහිය නොහැකි තරම් වාසි සහිත නම් එය බොරුවක් විය හැක.**

**ඔබ දැනුවත් විය යුතු කරුනු :**

- කැනඩා වීසා ලබා ගැනීමට හෝ කැනඩා පුරවැසිභාවය ලබා ගැනීමට ඔබ ආගමන නියෝජිතයෙකුට මුදල් ගෙවා ඔහුගේ හෝ ඇයගේ සේවය ලබා ගැනීම **අවශ්‍ය නැත**.

- ආගමන නියෝජිතයන්ට කැනඩා රජයේ නිලධාරීන් සමග විශේෂ සම්බන්ධතා **කිසිවක් නැත**. එ හෙයින් ඔවුන්ට ඔබට වීසාවක් ලබා දීමට සහතික විය **නොහැක**.

- කැනඩා තානාපති කාර්යාලවල, මහ කොමසාරිස් කාර්යාලවල සහ කැනඩා කොන්සලේට් කාර්යාලවල **බලයලත් නිලධාරීන්ට** පමණක් ඔබට වීසා අනුමත කල හැකිද, නොහැකිද යන්න තීරණය කල හැක.

- ව්‍යාජ ලිපි ලේඛන භාවිතා කිරීමට නොපෙලඹෙන්න. මෙවැනි වැරදි ක්‍රියාවන්හි ඔබ යෙදීමෙන් ඔබගේ වීසා අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

- අන්තර් ජාල වංචා සහ බොරු වෙබ් අඩවි පිළිබඳ දැනුවත් වන්න. පුරවැසිභාවය සහ කැනඩා ආගමන (CIC) සම්බන්ධ නිල වෙබ් අඩවියේ ලිපිනය www.cic.gc.ca වේ.

- මෙම වෙබ් අඩවියෙන් ඔබට අවශ්‍ය ඕනෑම **වීසා අයදුම්පතක් හෝ විස්තර නොමිලේ ලබා ගත හැක.**

- ලොව පුරා ඇති කැනඩා වීසා කාර්යාලවල ඉල්ලුම් පත්‍ර විශ්ලේෂණය සඳහා අය කරන ගාස්තු කැනේඩියානු මුදලින් එක සමාන වේ. එම මුදල අදාල රටේ විනිමය අනුපාතය හා සැසඳීමෙන් එම රටේ භාවිතා වන මුදලින් ගෙවිය හැක.

- කැනඩා වීසා කාර්යාල මගින් ඔබට කිසි විටකත්, යම් පුද්ගලයෙකුගේ පුද්ගලික බැංකු ගිණුමකට හෝ පුද්ගලික මුදල් හුවමාරු ආයතනයක ගිණුමකට මුදල් තැන්පත් කරන ලෙස **ඉල්ලා නොසිටී.**

- වැඩිදුර විමසීම් ඇතිනම්, පුරවැසිභාවය සහ කැනඩා ආගමන (CIC) කාර්යාලයෙන් හෝ ඔබ ප්‍රදේශයේ ඇති කැනඩා වීසා කාර්යාලයෙන් විමසන්න.

ඔබ ආගමන නියෝජිතයකුගේ **නිත්‍යානුකූල සේවය ලබා ගැනීමට** අදහස් කරන්නේ නම්, එවැනි නියෝජිතයන් පිළිබඳ වැඩිදුර විස්තර පහත දැක්වෙන cic වෙබ් අඩවියෙන් ලබා ගත හැක. මෙම නියෝජිතයන් තම සේවාවන් සඳහා මුදල් අය කරනු ඇත. (http://www.cic.gc.ca/francais/information/representants/index.asp).